# POLITICAL SCIENCE AND ITS SUB FIELDS (Part II)

# දේශපාලන මතවාද

ලිබරල්වාදය, සමාජවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, පැසිස්ට් වාදය, රාජ්‍ය සුභසාධන වාදය, නව ලිබරල් වාදය, ජාතික වාදය, වැනි දේශපාලන මතවාද ලෝක දේශපාලනයෙහි ලා විශාල කාර්යභාරයක් ඉටු කළ ඒවා ය.

දේශපාලන මතවාදයක් යනු සමාජයේ දේශපාලනයට බලපෑම් කරන, දේශපාලන ක්‍රියාකාරිත්වයට හා ගමනට මග පෙන්වන, සමාජයේ විශාල ජන කොටසක් ආකර්ෂණය කර ගැනීමට සමත් වන, දේශපාලන මතිමතාන්තර හා විශ්වාස ආදියෙන් සමන්විත නිශ්චිත අදහස් සමුච්චයකි. ඕනෑ ම දේශපාලන මතවාදයක්

- ❖එකිනෙකට සංගත අදහස් මාලාවකින් සමන්විත වේ.
- ❖සමාජයේ යම් යම් කොටස්වල දේශපාලන විඥානය, විශ්වාස සහ ඉදිරි දැක්ම හැඩ ගැස්වීමට ද සමත් වේ.
- ❖සමාජ කොටස් දේශපාලන ක්‍රියාකාරිත්වයට යොමු කිරීමේ හැකියාව ද සහිත ය.
- ❖මෙය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කළ හැකිය.

ClassWork.LK

# ලිබරල් වාදය

දේශපාලන මතවාදයක් ලෙස ලිබරල්වාදයේ ප්‍රධානතම මූලධර්මය වන්නේ පෞද්ගලික නිදහස යි. පෞද්ගලික නිදහස, සමාජයේ නිදහසේ මුල් ගල බවත්, එය ආර්ථික, සමාජ, සංස්කෘතික යන ක්ෂේත්‍රවල දී මූලික මූලධර්මය විය යුතු බවත් ලිබරල් වාදය විශ්වාස කරයි.

ලිබරල්වාදය ඓතිහාසික වශයෙන් වර්ධනය වූයේ යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදය බිහි වීමේ පසුබිමෙහි ය.

නිදහස් වෙළඳපොළ පිළිබඳ ලිබරල්වාදී ආර්ථික මූලධර්මය ''නිදහස'' පිළිබඳ ලිබරල්වාදී තේරුම් ගැනීම සමඟ බද්ධ වී තිබිණ. දේශපාලන ක්ෂේත්‍රය ද ''නිදහස්'' එකක් විය යුතු ය යන ලිබරල් දේශපාලන මතවාදය, පසු ව ප්‍රජාතන්ත්‍රවාදය සමඟ බද්ධ විය. ''ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය'' යන්න බිහි වූයේ ඒ වෙතිනි.

වර්තමාන ලෝකයේ දේශපාලන ආයතන, මූලධර්ම සහ භාවිතයන් හැඩ ගැස්වීමට ලිබරල් දේශපාලන මතවාදය ප්‍රධාන සාධකයක් වී තිබේ. එලෙස ලිබරල් වාදයේ ආභාසයෙන් ගොඩ නැඟුණු ආයතන, මූලධර්ම සහ භාවිත මෙසේ ය.

ClassWork.LK

ආයතන –

පාර්ලිමේන්තුව , ජනමාධ්‍ය, නිදහස අධිකරණය, සීමිත බලතල සහිත ආණ්ඩුව.

මූලධර්ම -

පුද්ගල නිදහස, බලතල වෙන් කිරීම, සංවරණ සහ තුළන ක්‍රම, නීතියේ ආධිපත්‍යය, මූලික අයිතිවාසිකම්, පෞද්ගලික දේපළ අයිතිය.

භාවිත -

නිදහස් මැතිවරණාල පුරවැසි අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ රාජ්‍යය ආර්ථික හා සමාජ ක්ෂේත්‍රයේ අවම ලෙස මැදිහත් වීම , ආගම සහ රාජ්‍යය වෙන් කිරීම දේශපාලන බලයට සීමා පැමිණවීම.

ClassWork.LK

# සමාජවාදය

19 වැනි සියවසේ දෙවන භාගයේ ආරම්භ වූ සමාජවාදය විසි වැනි සියවසේ දී ප්‍රබල දේශපාලන මතවාදයක් ලෙස පැතිරිණ. එය බිහි වූයේ ලිබරල්වාදයට සහ ධනවාදයට විවේචනයක් මෙන් ම විකල්පයක් ද වශයෙනි.

එම මූලික අදහස තව දුරටත් වර්ධනය වෙමින් ''සමාජවාදය'' යන්න ප්‍රබල මතවාදයක් බවට පත් කරන ලද්දේ මාක්ස්වාදය විසිනි. සමාජවාදය පිළිබඳ ව මාක්ස්වාදය ඉදිරිපත් කළ ප්‍රධාන ප්‍රවාදය වූයේ, සැබෑ සමාජවාදය ඇති කළ හැක්කේ ධනවාදී ක්‍රමය පෙරළා දමා, කම්කරු පන්තිය, පාලක පන්තිය බවට පත් කරන සමාජවාදී විප්ලවයකින් ය යන්න යි.

විසි වැනි සියවසේ දේශපාලනයෙහිලා සමාජවාදය ප්‍රධාන කාර්ය හතරක් ඉටු කෙළේ ය.

නිදහස, සමානාත්වය සහ සමාජ-දේශපාලන විමුක්තිය පිළිබඳව ලිබරල්වාදී මතවාදයට ප්‍රබල විකල්පයක් ගොඩ නැගීම.

ClassWork.LK

ධනවාදී ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයට විකල්ප වශයෙන් සමාජවාදී රාජ්‍යය පිළිබඳ ඉදිරි දැක්මක් ඉදිරිපත් කිරීම.

ධනවාදය හා බැඳුණු සූරාකෑම, සමාජ පීඩනය හා සමාජ අසමානතාව පිළිබඳ ව දැඩි විවේචනයක් ඉදිරිපත් කරමින්, පීඩිත ජන කොටස්වල සමානත්වය, අයිතිවාසිකම් හා සමාජ විමුක්තිය පිළිබඳ තේමාව දේශපාලන චින්තනයේ කේන්ද්‍රය වෙතට ගෙන ඒම.

යුරෝපීය මෙන් ම යුරෝපීය නොවන ලෝකයේ ද සමාජ /දේශපාලන නිදහස සඳහා වූ බහුජන ව්‍යාපාරවලට මඟ පෙන්වූ ප්‍රබල දේශපාලන මතවාදයක් වීම.

ClassWork.LK

# ජාතිකවාදය

දහවැනි සියවසේ පටන් ලෝකය පුරා පැවතුණු ප්‍රබලතම මතවාදයකි.

පළමුවෙන් යුරෝපයෙන් මතු වී පසු ව ආසියානු, අප්‍රිකානු සහ ලතින් ඇමරිකානු රටවල ප්‍රබල දේශපාලන මතවාදයක් බවට පත් විය.

දේශපාලන මතවාදයක් ලෙස ජාතිකවාදය ඉටුකර ඇති සහ තවමත් ඉටුකරන කාර්ය රැසක් වේ.

රාජ්‍යයක් ලෙසට සංවිධානය විය හැකි පොදු අනන්‍යතාවක් ඇති දේශපාලන ප්‍රජාවක් ලෙසට තමන් ගැනම පරිකල්පනය කිරීමේ මතවාදීය හා සංකල්පීය රාමුව ප්‍රජාවන්ට සපයන්නේ ජාතිකවාදයයි. භාෂාව, ආගම, සංස්කෘතිය සහ භූමි ප්‍රදේශය, එලෙස පොදු ප්‍රජාවක් හැටියට තමන් ගැනම පරිකල්පනය කිරීමට ප්‍රජාවලට ඉඩ සලසන අනන්‍යතා සාධක ය.

ClassWork.LK

නූතන ජාතික රාජ්‍යය (Nation State) මූලික වශයෙන් හැඩගැසී තිබෙන්නේ ජාතිකවාදය විසින් ජාතිය සහ රාජ්‍යය පරිකල්පනය කර ඇති ආකාරය අනුව ය.

භෞමික ඒකාග්‍රතාව, සංස්කෘතික ඒකත්වය, ජාතිය සහ රාජ්‍යය එකට සමපාත විය යුතු ය යන නූතන රාජ්‍යයේ පදනම් වාදී මූලධර්ම හැඩගැසී තිබෙන්නේ ජාතිකවාදී දේශපාලනයේ විවිධ ප්‍රකාශයන් ලෙස ය.

මේ අනුව පෙනී යන කරුණක් නම්, දේශපාලන මතවාද සමාජයේ දේශපාලන චින්තනය, විඥානය සහ භාවිතය සමඟ සමීප ව බැඳී තිබෙන්නා වූත්, දේශපාලන ආයතන සහ දේශපාලන පරිවර්තනයේ ගමන් මඟ හැඩ ගැස්වීමට දායක වන්නා වූත් තීරණාත්මක දේශපාලන සාධයක් වන බව යි.

ClassWork.LK

ClassWork.LK